Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# කෘෂි හා ආහාර තාක්ෂණය

## දැනුම මිනුම තරඟ - 2024

### රත්නපුර අධ්‍යාපන කලාපය

**සියලු ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.** **කාලය පැය 1 මිනිත්තු 15**

01) 2023 ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයට කෘෂිකාර්මික අංශයේ දායකත්වය ප්‍රතිශතයක් ලෙස දක්වන්න.

.......................................................................................................................

02) 2011 වර්ෂයේ දී ජාතික සංවර්ධන වැඩසටහනක් ලෙස ආරම්භ කරන ලද කෘෂිකාර්මික වැඩසටහන කුමක්ද?

.......................................................................................................................

03) පාරජම්බුල කිරණ ( UV ) මඟින් ශාක වලට ඇති කරන අහිතකර බලපෑමක් නම් කරන්න.

.......................................................................................................................

04) ශ්‍රී ලංකාවේ තෙත් කලාපයට අයත් කෘෂි පාරසරික කලාපයට අයත් කෘෂි පාරිසරික කලාප ගණන කීයද?

.......................................................................................................................

05) සටහන් නොවන වර්ෂාමානය තුළ එකතු වන ජල ප්‍රමාණයෙහි .......................................... අනුව වර්ෂාපතනය ප්‍රකාශ කරයි.

06) කෘෂි බෝග සංස්ථාපනයේ දී වැදගත් වන පාංශු ගැඹුර සඳහා අයත් වන පාංශු පැතිකඩෙහි කලාප මොනවා ද?.......................................................................................................................

07) ශ්‍රී ලංකාවේ ගංගා මිටියාවත් වල ව්‍යාප්ත වී ඇති පස් කාණ්ඩය නම් කරන්න.

.......................................................................................................................

08) බෝග වගාව සඳහා වඩාත්ම සුදුසු ජල තත්ත්වය කුමක් ද?

.......................................................................................................................

09) පසෙහි කැටායන හුවමාරු ධාරිතාව සඳහා වැදගත් වන පාංශු කලිල වර්ග දෙක නම් කරන්න.

.......................................................................................................................

10) බෑවුම් සහිත භූමි සඳහා යොදා ගත හැකි පාංශු සංරක්ෂණ වගා ක්‍රමය නම් කරන්න.

.......................................................................................................................

11) ගෝවා, අබ, සලාද යන බෝග අයත් වන ශාක කුලය නම් කරන්න.

.......................................................................................................................

12) වී බෝගයේ විද්‍යාත්මක නාමය ද්විපද නාමකරණයට අනුව නිවැරදිව ලියා දක්වන්න.

.......................................................................................................................

13) වම්බටු බෝග සිටුවීමේ දී පේළි අතර හා පේළි තුළ සිටුවන පරතර සඳහන් කරන්න.

.......................................................................................................................

14) බීජ සංස්ථාපනය කරන ගැඹුර තීරණය කරනු ලබන්නේ බීජයේ කුමන සාධකය අනුව ද?

.......................................................................................................................

15) බඩ ඉරිඟු වගා කිරීම සඳහා වඩාත් සුදුසු බෝග සංස්ථාපන ක්‍රමය කුමක් ද?

.......................................................................................................................

16) බිම් සැකසීමේ උපකරණ භාවිතා කරන අවස්ථාව අනුව වර්ගීකරණය කිරීමේ දී රොටවේටරය හා රිජරය අයත් වන කාණ්ඩය නම් කරන්න.

.......................................................................................................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

17) තවාන් පැළ වලට රෝග බෝ වීම අවම කිරීම සඳහා බීජ තවාන් කිරීමට ප්‍රථම සිදු කරනු ලබන බීජ ප්‍රතිකාර ක්‍රමය කුමක් ද?

.................................................................................................................................

18) මිල අධික දෙමුහුම් බෝග ප්‍රභේද සහ ගෝවා , බටු , තක්කාලි , මිරිස් ආදී කුඩා බීජ සහිත බෝග සිටුවීම සඳහා වඩාත් සුදුසු තවාන් වර්ගය කුමක් ද?

.................................................................................................................................

19) තවානෙහි ඇති පැළ ක්ෂේත්‍රයේ සිටුවීමට සුදුසු තත්ත්වයට ක්‍රමයෙන් හුරු කිරීම .................................................................................................ලෙස හඳුන්වනු ලැබේ.

20) බෝග වල පරාගණයට බාධා විය හැකි ජල සම්පාදන ක්‍රමය කුමක් ද?

.................................................................................................................................

21) බෝග වලට ජලය සම්පාදනය කිරීමේ දී ඉතා කාර්යක්ෂම ජල සම්පාදන ක්‍රමය කුමක් ද?

.................................................................................................................................

22) භූගත ජලවහනයේ දී සිලින්ඩරාකාර කාණු සකසා අතිරික්ත ජලය ඉවත් කිරීමට සකසන කාණු වර්ගය නම් කරන්න.

.................................................................................................................................

23) ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ජල කළමණාකරණ මධ්‍යස්ථානය ( IWMI ) පිහිටා ඇති නගරය කුමක් ද?

.................................................................................................................................

24) ජාත්‍යන්තර ජල දිනය යෙදී ඇත්තේ කවදා ද?

.................................................................................................................................

25) බඩ ඉරිඟු ශාක වල මේරූ පත්‍ර අග දම් පැහැයන් ගන්නේ කුමන පෝෂකයක් ඌන වීම නිසා ද?.............................................................................................................................

26) ශාක වල පුෂ්පීකරණය වඩාත් හොඳින් සිදු වන්නේ ............................................................ අඩංගු පොහොර යෙදීමෙනි.

27) ලා අළු පැහැති ගෝලාකාර කැට සහිත ජලයෙහි මඳක් දිය වන පොහොර වර්ගය නම් කරන්න.

.................................................................................................................................

28) වී වගාවට මතු පිට පොහොර ලෙස යොදා ගැනෙන TDM ( බණ්ඩි පොහොර ) මිශ්‍රණයෙහි අඩංගු පෝෂක නම් කරන්න.

.................................................................................................................................

29) ගව ආහාර ලෙස ගෙන්වන ලද ආක්‍රමණශීලී වල් පැළෑටියක් නම් කරන්න.

.................................................................................................................................

30) පළල් පත්‍ර , පන් හා තෘණ යන වල් පැළ වර්ග තුන ම මර්ධනය කෙරෙන වල්නාශක වර්ගය හඳුන්වන නම කුමක් ද?

.................................................................................................................................

31) ශාක පත්‍ර ඉදලත් ආකාරයට විහිදීම ( Witches broom ) යන රෝගය ඇති කරන රෝග කාරකය නම් කරන්න.

.................................................................................................................................

32) පිලා අවධිය පසෙහි ගත කර අඹ , කෙසෙල් , පේර ආදී ඵල වලට හානි කරන කෘමි පළිබෝධකයා නම් කරන්න.

.................................................................................................................................

33) ශ්‍රී ලාංකීය ගොවි ජනතාවගේ එදිනෙදා කෘෂි ගැටලු සඳහා නොමිලේ උපදෙස් ලබා ගත හැකි දුරකථන සේවා අංකය ලියන්න.

.................................................................................................................................

34) වී වගාවේ මහ කන්නයේ දී අස්වනු නෙළීම සිදු කරන කාල සීමාව ..................................... සිට ................................................ දක්වා ය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

35) ශ්‍රී ලංකාවේ ප්‍රථමයෙන් බිහි කරනු ලැබූ දෙමුහුම් වී ප්‍රභේදය කුමක් ද?

..........................................................................................................................

36) වී වගාවේ මූලික බිම් සැකසීමේ දී දෙවන හීය හැඳින්වීමට යොදා ගන්නා වෙනත් නමක් ලියන්න.

..........................................................................................................................

37) ඒක බීජ පත්‍රි බීජ වල ආහාර සංචිත කෙරෙන කොටස කුමක් ද?

..........................................................................................................................

38) දෙල් හා බෙලි යන ශාක වල වර්ධන ප්‍රචාරණය සිදු කෙරෙන ව්‍යුහය නම් කරන්න.

..........................................................................................................................

39) බීජ 50 ක නියැදියන් ගෙන ප්‍රරෝහණ ප්‍රතිශතය පරීක්ෂා කිරීමේ දී බීජ වලින් 13 ක් ප්‍රරෝහණය වී නොතිබුණි. මෙම බීජ නියැදියේ ප්‍රරෝහණ ප්‍රතිශතය සොයන්න.

..........................................................................................................................

..........................................................................................................................

40) සිටුවීමට සකස් කරනු ලබන අතු කැබැල්ලක පහළ කොටස $45^0$ ක පමණ ආනතියකින් යුතුව කැපීමට හේතුව ලියන්න.

..........................................................................................................................

41) ඒකීය සූර්ය ප්‍රචාරකයක පාලනය කරනු ලබන පරිසර තත්ත්ව දෙකක් සඳහන් කරන්න.

..........................................................................................................................

42) ශාක බද්ධ කිරීමක් සාර්ථක වීමට ශාක කොටස් දෙකෙහි සම්බන්ධ විය යුතු කොටස වනුයේ ...................................................................................................................... යි.

43) දඬු කැබැලි සිටු වීමේ දී ඒවායේ වැඩිපුර පත්‍ර කපා ඉවත් කිරීමට හේතුව කුමක් ද?

..........................................................................................................................

44) නිර්පාංශු ද්‍රව මාධ්‍ය වගාවක පෝෂක මාධ්‍යයේ තිබිය යුතු විද්‍යුත් සන්නායනතා ( EC ) අගය ලියන්න.

..........................................................................................................................

45) ගෝවා , සලාද , කංකුං යන බෝග සඳහා සුදුසු නිර්පාංශු වගා ක්‍රමය කුමක් ද?

..........................................................................................................................

46) ශ්‍රී ලංකාවේ උඩරට ගෙවතු ආශ්‍රිතව දක්නට ලැබෙන වගා ක්‍රමය කුමක් ද?

..........................................................................................................................

47) වර්ෂය පුරාම වරින් වර ආදායම් ලබා ගත හැකි වගා ක්‍රමය කුමක් ද?

..........................................................................................................................

48) 2023 වර්ෂයේ ශ්‍රී ලංකාවේ පොල් වගාවට වැළඳුනු දිලීර ආසාදන රෝගය නම් කරන්න.

..........................................................................................................................

49) ශ්‍රී ලංකාවේ වැඩිම සහල් නිෂ්පාදනයක් ලබා දෙන දිස්ත්‍රික්කය කුමක් ද?

..........................................................................................................................

50) 2024 වර්ෂයේ ලෝක පරිසර දින තේමාව කුමක් ද?

..........................................................................................................................